**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රවෘත්ති සංස්කාරක** **ජූනි , 2020**

**මාධ්‍ය නිවේදනය**

**ශ්‍රී ලංකා කාල පරිහරණ සමීක්ෂණය– 2017**

**අවසාන වාර්තාව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය**

**දු.ක.: 011-2147459** **ෆැක්ස් : 011-2147447** **විද්‍යුත් තැපෑල:sample.survey@statistics.gov.lk**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට පවත්වන ලද ශ්‍රී ලංකා කාල පරිහරණ සමීක්ෂණය 2017 වසරේ පවත්වන ලද අතර, එහි අවසන් වාර්තාව ප්‍රකාශයට පත්කොට ඇත. මෙම සමීක්ෂණය මගින් රැස්කරනු ලැබූ තොරතුරු මගින් රටේ ජනතාවගේ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය වටිනා තොරතුරු රැසක් මෙන්ම තිරසර සංවර්ධන දර්ශකාංකයක් වන “ගෙවීමක් සිදු නොකර සිදුකරන ගෘහස්ථ සේවා සහ රැකබලා ගැනීමේ කටයුතු වෙනුවෙන් වැයකරන කාලය” පිළිබඳව ද තොරතුරු සපයනු ලබයි.

2017 වර්ෂයේ ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයට සමගාමීව එහි 4 වන කාර්තුව සඳහා තෝරාගන්නා ලද නියැදියේ නිවාස ඒකක 6,440 ක් සඳහා මුළු ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මෙම සමීක්ෂණය සිදු කරන ලදී. නියැදියට තේරුණු නිවාස ඒකක වල වයස අවුරුදු 10 හෝ ඊට වැඩි පුද්ගලයන්ගෙන් ඔවුන් විසින් දවසේ පැය 24 තුලදී සෑම විනාඩි 15 ක් තුලදීම ඔවුන් විසින් සිදු කළ සියළු කාර්යයන් පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. ඊට අමතරව, එම කාර්යයන් සිදුකල ස්ථානය (නිවසේද, කාර්යාලයේද, පොදු ස්ථානයකද ආදී වශයෙන්) මෙන්ම ක්‍රියාවන් කිහිපයක එකවර යෙදුනේ නම් එම තොරතුරුත් විශේෂයෙන් සකස් කරන ලද දින පොතක නිවැසියන් විසින්ම සටහන් කරන ලද ක්‍රමවේදයක් මගින් දෙපාර්තමේන්තු සමීක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ලබා ගන්නා ලදී. එම ක්‍රියාකාරකම් වර්ගීකරණය කිරීම සහ කේත කිරීම සඳහා අන්තර්ජාතික කාල පරිහරණ ක්‍රියාකාරකම් වර්ගීකරණය (**ICATUS** 2016) භාවිතා කරන ලදී.

ඒ අනුව, මෙම සමීක්ෂණය මගින් රැස් කරන ලද වයස අවුරුදු 10 හා ඊට වැඩි පුද්ගලයන්ගේ, රැකියාව හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්, ගෙවීම් රහිතව සිදුකරන ගෘහස්ථ සේවා, වැඩිහිටි හෝ ළමා රැකබලා ගැනීමේ කටයුතු, ස්වේච්ඡා සේවා, අධ්‍යාපනික කටයුතු, සංස්කෘතික කටයුතු, විවේකය හා ජනමාධ්‍ය ඇසුර හා පෞද්ගලික ස්වස්ථතාවය ආදී කටයුතු වෙනුවෙන් වැයකරන කාලය හා ඒ ආශ්‍රිත තවත් වැදගත් තොරතුරු රාශියක් ඉහත වාර්තාව මගින් ප්‍රකාශයට පත් කර ඇත.

මෙම වාර්තාව මගින් ප්‍රකාශයට පත් කර ඇති කාල පරිහරණය පිළිබඳ තොරතුරු ඇස්තමේන්තු කිරීම සඳහා පහත සඳහන් දර්ශක 3 යොදාගන්නා ලදී.

1. විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගීත්ව අනුපාතය = $\frac{\text{ක්‍රියාකාරකම සඳහා සහභාගී වූ පුද්ගලයන්}}{\text{මුළු ජනගහනය}}$ X 100%

2. විවිධ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වූවන්ගේ මධ්‍යන්‍ය කාලය = $\frac{\text{අදාල ක්‍රියාකාරකම සඳහා සහභාගී වූවන් ගත කළ මුළු කාලය}}{\text{ක්‍රියාකාරකම සඳහා සහභාගී වූ පුද්ගලයන් ගණන}}$

3. විවිධ ක්‍රියාකාරකම් සඳහා සමස්ථ ජනගහනයේ මධ්‍යන්‍ය කාලය = $\frac{\text{අදාල ක්‍රියාකාරකම සඳහා සහභාගී වූවන් ගත කළ මුළු කාලය}}{\text{මුළු ජනගහනය}}$

එම දර්ශක යොදා ගනිමින් උක්ත කාර්යයන් සඳහා පුරුෂයින්ගේ සහ ස්ත්‍රීන්ගේ සහභාගීත්ව අනුපාතය, එම එක් එක් ක්‍රියාකාරකම සඳහා සහභාගී වූ පුද්ගලයන් සඳහා දිනකට සහභාගී වූ මධ්‍යන්‍ය කාලය හා මුළු ජනගහනය සඳහා දිනකට සහභාගී වූ මධ්‍යන්‍ය කාලය පුරුෂයන් සහ ස්ත්‍රීන් සඳහා වෙන වෙනම ගණනය කර ඇති අතර, ඒ සම්බන්ධව විස්තර උක්ත වාර්තාව මගින් ප්‍රකාශයට පත් කොට ඇත.

ඉහත තොරතුරු වලට අමතරව තවත් වැදගත් තොරතුරු රාශියක් අන්තර්ගතව සකස් කර ඇති 2017 වර්ෂයේ පවත්වන ලද කාල පරිහරණ සමීක්ෂණයේ අවසන් වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ **(www.statistics.gov.lk)** ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

ආචාර්ය අයි.ආර්. බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව